
උඩවැඩියා (Orchid)



"උඩවැඩියා" ලොව දෙවන විශාලතම සපුෂ්ප ශාක කුලය වන Orchidacea කුලයට අයත් වේ. ඒකබීජ පත්‍රී බහුවාර්ශික පැළෑටි කාණ්ඩයට අයත් උඩවැඩියා, ධ්‍රැව හා කාන්තාර ප්‍රදේශ හැර ලෝකයේ සියලුම දේශගුණික කලාපවල ව්‍යාප්තව පවතී. අධික විවිධත්වයක් සහිත මෙම ශාකයේ, ගණ 900ක් පමණ හා විශේෂ 30,000 ට අධික සංඛ්‍යාවක් ලොව පුරා දැකගත හැකිය. උඩවැඩියා අදින් වසර මිලියන 112 ට පමණ පෙර ක්‍රිටේෂියස් (Cretaceous) යුගයේ දී ලොව පහල වී ඇති ලෙස සලකනු ලැබේ. පුෂ්පවල, වර්ණය හා රූපීය විවිධත්වය නිසා උද්‍යාන අලංකරණ හා විසිතුරු මල් වගාවේ දී උඩවැඩියා වඩාත් ජනප්‍රිය වේ.

ශ්‍රී ලංකාවේ උඩවැඩියා විශේෂ 193ක් වාර්තා වන අතර ඉන් විශේෂ 62 ක් මෙරටට ආවේණි--කය. විවිධ පරිසරවල ජීවත්වීමට අනුවර්තනය වී ඇති උඩවැඩියා විශේෂ බොහෝමයක් අපිශාක (Epiphytes) ලෙස දැකිය හැකිය.

වැනිලා (*Vanilla*)



ඇමරිකානු සම්භවයක් සහිත *Vanilla* ගණය උතුරු ඇමරිකාව, දකුණු ඇමරිකාව, අප්‍රිකාව හා ආසියාව තුල ව්‍යාප්තව ඇති අතර විශේෂ 132 ක් පමණ වාර්තා වේ.

ශ්‍රී ලංකාවේ විශේෂ 4ක් දැකිය හැක.

- *Vanilla planifolia*
  ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් විශේෂයකි. ආහාර සුවඳ--කාරකයක් හා රසකාරකයක් ලෙස භාවිත කරයි.

- *Vanilla walkeriae*
  දේශීය විශේෂයකි.

- *Vanilla wightii*
  දේශීයව හමුවන දත්ත ඌනව පවතින විශේෂයකි.

- *Vanilla moonii*
  ශ්‍රී ලංකාවට ආවේණික පහතරට තෙත් කලාපීය වනාන්තරවලට සීමා වී ඇති විශේෂයකි.

Vanilla moonii



මෙම විශේෂය 1864 දී G.H.K. Thwaites නම් විද්‍යාඥයා විසින් Enumeration of Ceylon Plants පොතෙහි ප්‍රථම වරට ලෝකයට වාර්තා කර ඇත. මෙම ශාකය මාංශලමය, ඕවලාකාර/රේඛීය අණ්ඩාකාර පත්‍ර දරන, ආරෝහක වැලක් ලෙස ශාක මත වැඩේ. බොහෝදුරට *Vanilla planifolia* ට සමානය. අප්‍රේල් හා සැප්තැම්බර් මාසවල මල් හටගනී. ඒවා අඳුරු පැහැයක් ගන්නා අතර පෙතිවල අග සුදු-කහ පැහැයකින් යුක්තය. මලෙහි අධරය (Lip) ඉහල 1/3 කොටසේ සිට අග්‍රය දක්වා, දෘඩ ලෝම සහිත පුළුල් පටි දැකගත හැකි අතර, එම පටිවල පහළ අර්ධකවාකාර මතුපිටක් දැකගත හැකිය. මලෙහි මෙම ලක්ෂණ *Vanilla moonii* වෙන්කර හඳුනාගැනීමට යොදාගනී. රේඛීය අණ්ඩාකාර ඵල දරයි. ප්‍රධාන වශයෙන්, කඳ කොටස කැඩීයාම මගින් (වර්ධක ප්‍රචාරණයෙන්) ප්‍රශස්ත ක්ෂුද්‍ර පාරිසරික තත්ත්වයන් වලදී වර්ධනය වේ.

තර්ජන

- වනාන්තර වල ප්‍රමාණය හා ගුණාත්මකභාවය හායනයට ලක්වීම නිසා ක්ෂුද්‍ර පාරිසරික තත්ත්වයන් විනාශ වීම.
- ශාක ස්වභාවික පරිසරයෙන් ගලවා ඉවත් කිරීම. (විසිතුරු මල් වගාව, පෙව මංකොල්ලය)
- මෙම ශාක විශේෂය පාරිසරික හා දේශගුණික තත්ත්ව වල වෙනස් වීමට අධි සංවේදීතාවයක් පෙන්වන බැවින් වර්තමානයේ දැඩි ලෙස වඳවීයාමේ තර්ජනයට ලක් වී ඇත.
- ශාකයේ පරාගකාරකයින් අඩුවීමද මෙම ශාකයට පවතින ප්‍රභල තර්ජනයකි.

ආරක්ෂිත තත්ත්වය

2020 ජාතික රතු දත්ත වාර්ථාවට අනුව දැඩි ලෙස වඳවීයාමේ තර්ජනයට ලක්වූ (Critically Endangered) විශේෂයක් ලෙස නම් කර ඇත.

වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇති වනසත්ත්ව හා වෘක්ෂලතා විශේෂ පිළිබඳ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතියට (CITES) අනුව ඇමුණුම 2 යටතේ මෙම විශේෂයේ පැවැත්ම තහවුරු කිරීම හා අවභාවිතය අවම කිරීම සඳහා නිදර්ශක වෙළඳාම යාමනය කිරීම.

වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 42 වගන්තිය යටතේ ආරක්ෂිත ශාක විශේෂයක් ලෙස නම් කර ඇත.

ව්‍යාප්තිය

උන්නතාංශය අඩි 2,000ට අඩු පහතරට තෙත් කලාපීය වනාන්තරවලට සීමා වී පවතී. ඒ අතර දොඹගස්කන්ද රක්ෂිත වනාන්තරය ප්‍රධාන තැනක් ගනී.

දොඹගස්කන්ද රක්ෂිත වනාන්තරය

පහතරට තෙත් කලාපීය වැසි වනාන්තරයක් ලෙස සැලකෙන දොඹගස්කන්ද රක්ෂිතය, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල පිහිටා ඇත. කොළඹ නගරයට ආසන්න මෙම වනාන්තරය, හෙක්ටයාර 282.6ක් පුරා විහිදී ඇත.

ඉහල පෙව විවිධත්වයක් සහිත මෙම වනාන්-තරය තුළ උඩවැඩියා විශේෂ 30ක් පමණ වාර්තා වී ඇති අතර, ඒ අතරින් *Vanilla moonii* ශාකය විශේෂ වැදගත්කමකින් යුතු වේ.

සැකසුම
©2025 ශ්‍රී ලංකා තරුණ සත්ත්වවේදීන්ගේ සංගමය
srilankayza@gmail.com

අනුග්‍රහය
වන සත්ත්ව හා ස්වභාව ආරක්ෂණ සංගමය
හේමාස් හොල්ඩින්ග්ස් සමාගම

දැඩි ලෙස වඳවීයාමේ තර්ජනයට ලක්වූ

Vanilla moonii

